**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 23 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට **හිඟුරක්ගොඩ** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබුණු නමුත්, ඉඩම් සහ ඊට අයත් ගොඩනැගිලි 29 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබුණු නමුත් ජල යෝජනා ක්‍රම 5 කට අයත් සෙන්ට්‍රික් ජල මෝටර් 5 ක වටිනාකම් හා ජීව වායු නිපදවීමේ කට්ටලයක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු ට්‍රැක්ටරයක්, යන්ත්‍ර සහ උපකරණ කට්ටල 27 ක් ප්ලාස්ටික් මේස 2 ක් සහ ලිපිකරු මේසයක වටිනාකම වූ රු. 350,430 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) දේශීය ණය සහ සංවර්ධන අරමුදල යටතේ ලබාගෙන තිබුණු ණය මුදල් තුනකට අදාල වාරික සහ පොලිය ගෙවිම සභාව විසින් පැහැරහැර තිබීම තුළ ණය සැපයුම් ආයතනය විසින් අදාල ණය නැවත ලේඛනගත කිරිමේදී සමාලෝචිත වර්ෂය අවසානයට එම ආයතනයට ලැබිය යුතු ණය මුදල රු.49,018,430 ක් වශයෙන් හෙළිදරව් කර තිබුණු අතර සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වගකීම රු. 31,127,842 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වගකීම් රු. 17,890,588 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව විසින් අනුගමනය කළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළත් සටහන්, මූල්‍ය ප්‍රකාශන සමඟ අනාවරණය කර නොතිබුණි.

1.3.3 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම
---------------------------------------------------

පහත දැක්වෙන නිති රිති , රෙගුලාසි යනආදි අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 150(1),152(1) හා 153(1) වගන්ති | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සහ සංවර්ධනය නොකරන ලද ඉඩම් පිළිබඳ වූ ලැයිස්තු පිළියෙල කර වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| | රිති අංක 218 | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි, වාර්ෂිකව සමීක්ෂණයට ලක්කළ යුතු වුවත්, සභාව විසින් කිසිදු වර්ෂයක් සඳහා එවැනි සමීක්ෂණයන් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) | xxiv වැනි පරිච්ජේදයේ 4 වගන්තිය | විශ්‍රාම ගිය, මියගිය නිලධාරින් 20 දෙනෙකුගෙන් වර්ෂ 15 – 25 අතර කාලයක සිට රු. 302,394 ක මුදලක් අයවිය යුතුව තිබුණි. |
| (ii) | xxiv වැනි පරිච්ජේදයේ 4.5 උපවගන්තිය | 1980 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ කාලය තුල සේවය හැර ගොස් තිබෙන නිලධාරින් 16 දෙනෙකුගෙන් අයවිය යුතු, රු. 183,645 ක මුදල අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | චක්‍රලේඛ | |
| (i) | 2005 නොවැම්බර් 08 දිනැති පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 3.1 හා 3.2 ජේද | සභාව සතු ඉඩම් 93 ක් සම්බන්ධයෙන් වූ මැනීම් සිදුකර, එම ඉඩම් සහ ඒවායේ තිබෙන ගොඩනැගිලි නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාවට පවරාගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | 2002 දෙසැම්බර් 09 දිනැති උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක එන්සීපී/2002/11 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 04 ජේදය | 2015 දෙසැම්බර් 31 දින වන විට ස්ථානමාරුවී ගොස් තිබෙන නිලධාරින් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 331,016 ක ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (iii) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | අවම වශයෙන් වසර 5 කට වරක් කඩ කුලි සංශෝධනය කර ඒ අනුව ගාස්තු අයකළ යුතු වුවද, එම උපදෙස් මත කටයුතු කිරිමකින් තොරව අවිධිමත් පදනමකින් කඩ කුලී අයකර තිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 689,653 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 5,289,651 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 වරිපනම් බදු

--------------

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට රජයේ ආයතන 06 කින් ලැබියයුතු රු. 362,953 ක් වූ හිඟ වරිපනම් බදු වර්ෂ 02 කට අධික කාලයක සිට අයකරගැනීම සඳහා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වරිපනම් බදු ගෙවියයුතු බදුකරුවන් 149 කින් අයවියයුතු රු. 802,291 ක මුදලක් වර්ෂ 3 සිට වර්ෂ 10 වැඩි කාලයක සිට හිගව පැවති අතර, එම මුදල් අයකර ගැනිම සඳහා සභාව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්

-------------------

(අ) සභාවට අයත් ජල යෝජනා ක්‍රම 7 කින් වර්ෂ 1 – 3 අතර කාලයක සිට අයවිය යුතු රු. 294,597 ක් වූ හිඟ ජල ගාස්තු අයකර ගැනිමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට මළ අපවහන පද්ධතිවලට අදාලව රු. 243,442 ක් වූ මුදලක් අයවීමට තිබුණු අතර, ඉන් රු. 175,290 ක මුදලක් ගෘහස්ථ 26 කට අදාලව වර්ෂ 2 සිට 3 දක්වා කාලයක් තුළ අයවීමකින් තොරව පැවතුණි.

(ඇ) 2015 මැයි සිට නව තක්සේරු කුලිය අනුව හා ඉකුත් මාසය තුළ හිඟ කුලියද ඇතුළුව කඩ කාමර 40 කින් මාස 06 කට වැඩි කාලයක් සඳහා රු. 618,023 ක් වූ හිඟ කුලී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අදායම් ඉපයීමේ කාර්යය සඳහා උපයෝගී කරගෙන තිබුණු වාහන 06 කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 447,110 ක මුදලක් අයවිමට තිබුණු අතර, එම මුදල අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් භූමියේ ඉදිකර ඇති, නීතීඥ කාර්යාල කාමර 16 ක් සඳහා ලැබියයුතු රු. 3,465,325 ක් වූ ටෙන්ඩර් බදු කුලි වර්ෂ 2 කට අධික කාලයක සිට හිඟව පවතින අතර, අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඊ) නීතීඥවරුන් පරිහරණය කරනු ලබන කඩ කාමර 16 න් 2014 සහ 2015 වර්ෂ සඳහා අයවීමට තිබෙන රු. 192,000 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සභාව සතු කඩ කාමර 80 ක් සම්බන්ධයෙන් වූ කුලිය 2014/15 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නියමකර සභාවට ලබාදී තිබුණද, එම කුලිය කඩහිමියන් විසින් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන්, මසකට රු. 67,225 ක කඩකුලී ආදායමක් සභාවට අහිමිව ගොස් තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) 2014 නොවැම්බර් මාසයේදි මහජන උපයෝගීතාවයන් සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන්, සභාවට ලබාදි තිබුණු ගැල්වනයිස් බට 624 න්, බට 256 ක් ඇලහැර ප්‍රාදේශීය සභාවට අවිධිමත්ව ලබාදී තිබුණු අතර, තවත් බට 108 ක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් විසින් රැගෙන ගොස් තිබෙන අතර එම බට 364 ආපසු ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා අරමුදලින් රු. 76,000 ක මුදලක් වැයකර 2010 ජුනි මාසයේදී මිලට ගෙන තිබුණු ලැප්ටොප් පරිගණකය සභාවේ සභාපති වශයෙන් 2010 – 2014 කාලයේදී කටයුත කළ සභාපතිවරයා විසින් පෞද්ගලික පරිහරණය සඳහා රැගෙන ගොස් තිබුණු අතර එය ආපසු සභාවට ලබාගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන උපකරණ කට්ටලය 2009 වර්ෂයේදී ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබාදී තිබුණු අතර, රු 21,500 ක් පමණ වූ හිඟ කුලී වාරික සහ අදාල යන්ත්‍රය ආපසු සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කාර්යාලීය නිලධාරින්ගේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කරන ඇඟිලි සලකුනු යන්ත්‍රය වසර ගණනාවක සිට අක්‍රීයව පවතින අතර, නව යන්ත්‍රයක් මිලට ගැනිමට හෝ පවතින යන්ත්‍රය අළුත්වැඩියා කිරිමට හෝ වගකිව යුතු නිලධාරින් කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි.

(ඉ) කාර්යාලීය නිලධාරින්ගේ පැමිණීමේ/පිටවීමේ ලේඛනයේ පිටවීමේ වේලාවන් බොහෝ අවස්ථාවන්හිදී, සාවද්‍ය ආකාරයට වෙනස්කර තිබුණු අතර දිගින් දිගටම පවතින එවැනි ක්‍රියාමාර්ග වැළැක්වීම සඳහා කළමනාකාරිත්වය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.2 පාරිසරික ගැටළු

------------------

(අ) වසර ගණනාවක සිට සභා බලප්‍රදේශයෙන් දෛනිකව එකතුවන කැලි කසල රොටවැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අක්කර 7 ක භූමි ප්‍රදේශයක් වෙත විවෘතව බැහැර කරනු ලබන අතර, ඒ හේතුවෙන් ප්‍රදේශය පුරා මහත් දූර්ගන්ධයක් මෙන්ම පොලිතීන් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රදේශය පුරා විසිරි තිබීමෙන්, මහත් පාරිසරික විනාශයක් සිදුවෙමින් පවතින බව නිරික්ෂණය විය.

(ආ) හිගුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගලි බවුසරය යොදා ගනිමින් හබරණ අඩවියේ ගල්ඔය රක්ෂිතයට 2011 වර්ෂයේ සිට දිගින් දිගටම මළ අපද්‍රව්‍ය මුදාහරිනු ලබන අතර, ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර පත්‍රයක් ලබාගෙන නොතිබුණි. 2016 වර්ෂය සඳහා දිසා වන කාර්යාලයෙන් ලිඛිත අවසරය ලබාගෙන තිබුණද, විවෘත භූමියකට බැහැර කෙරෙන මළ අපද්‍රව්‍ය හේතුවෙන්, පාරිසරික ගැටළු ඇතිවීමේ වැඩි ඉඩකඩක් පවතින බව නිරික්ෂණය විය.

3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

(අ) ද්විතීයික වැටුප් කාණ්ඩයට අයත් ආදායම් පරිපාලක තනතුරු 02 ක්ද, ප්‍රාථමික වැටුප් කාණ්ඩයට අයත් තනතුරු 04 ක්ද, පුරප්පාඩුව පවතින අතර අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ප්‍රාථමික මට්ටමේ 11 දෙනෙක් සේවයේ නිරතව සිටින අතර, ඔවුන්ගේ වැටුප් සහ වෙනත් දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.4,370,388 ක් ගෙවා තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව අනියම් හා කොන්ත්‍රාත් පදනම මත 2014 හා 2015 වර්ෂ තුල 23 දෙනෙකු සභාවට බඳවාගෙන තිබුණු අතර, ඔවුන් වෙනුවෙන්ද සමාලෝචිත වර්ෂයේදී වැටුප් සහ වෙනත් දීමනා වශයෙන් රු. 6,033,718 ක් ගෙවා තිබුණි.

04. යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

----------------------------------------

4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

----------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව ප්‍රාදේශීය සභා පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇති බව සඳහන් කර තිබුණද, අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් නොකෙරුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ක්‍රියාත්මක කිරිමට කටයුතු කර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

-----------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

කාර්යාල පරිශ්‍රය තුල වර්ෂ 5 කට අධික කාලයක සිට රඳවා තබා තිබෙන මිට්ෂුබිෂි කැබ් රථය, ෆෝර්ඩ් ට්‍රැක්ටරය හා රෝද හතරේ ට්‍රැක්ටරය ස්වභාවික ආපදාවන්ට ලක්වෙමින්, විනාශවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) සණ අපදුව කළමනාකරණය